**<u>මහනුවර මහා නගර සභාවේ මහජනධාර දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රම මිලදීගැනීමේ පදනම මත මැහුම් උපදේශක සහායක සේවය ලබා ගැනීම</u>**

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදීගැනීමේ පදනම මත මැහුම් උපදේශක සහායක සේවාව ලබාගැනීමට නියමිත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සේවාවේ නාමය සඳහන් කර 2025.05.02 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**<u>මැහුම් උපදේශක සහායක සේවය</u>**

1. මිලදි ගැනීමට නියමිත සේවාව : ශ්‍රම මිලදීගැනීමේ පදනම මත මැහුම් උපදේශක සහායක සේවාව ලබාගැනීම

2. දීමනාව : දෛනිකව රු. 1926.66 බැගින් දීමනාවක් ගෙවනු ලැබේ. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි PL 1 කාණ්ඩයේ ආරම්භක වැටුප පදනම් කරගනිමින්)

3. කායික සුදුසුකම් : අදාල සේවාව ලබා දිමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. අධ්‍යාපන සුදුසුකම් : විෂයයන් 02 (දෙකකට) සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් 06 (හයකින්) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එකවර සමත්වී තිබිය යුතුය

5. අතිරේක සුදුසුකම් : වසරක් හෝ ඊට වැඩි කාල සීමාවක මැහුම් කර්මය පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබීම

6. වෘත්තීය සුදුසුකම් : මැහුම් උපදේශනය පිළිබඳව පිළිගත් ආයතනයකින් ලබා ඇති පළපුරුද්ද

7. වෙනත් සුදුසුකම් :
   - අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
   - බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
   - කාන්තා අයදුම්කරුවන් පමණක් අයදුම්කළ යුතුය.

8. වයස : සියළුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

7. තෝරා ගැනීමේ ක්‍රමය : සුදුසුකම්ලත් නිලධාරීන් පහත කොන්දේසිවලට යටත්ව සේවයට තෝරා ගනු ලැබේ.
   - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් ලබා ගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සේවයේ යොදවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව 01කි.
   - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු සේවා සපයා ගැනීම සඳහා යොදවා ගනු ලැබේ.

8. සේවා කොන්දේසි :

- සේවය සපයා ගැනීමේ කාලය බදවාගැනීමේ දින සිට වසරකි. සේවා අවශ්‍යතාවය මත කාලය දීර්ඝ කිරීම නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ඇත.

- අවශ්‍ය ඕනෑම අවස්ථාවක සේවය අවසන් කිරීමේ බලය නාගරික කොමසාරිස් සතු වේ.

- තෝරාගත් අයවලුන් යම් අවස්ථාවක සේවයෙන් ඉවත්වේ නම් මාසයකට පෙර දැනුම් දීමක් සිදුකළ යුතුය.

- මෙම සේවයේ යොදවා ගැනීම හුදෙක් සේවා අවශ්‍යතාවය මත පමණක් වන බැවින් රජයේ කිසිදු තනතුරක් දැරීම සඳහා එය අයිතිවාසිකමක් නොවේ.

- තෝරාගන්නා අයදුම්කරු මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සමඟ සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

සටහන :- මෙම සේවා සපයා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

❖ අයදුම්පත්‍ර යොමු කිරීමේදී ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරනු ලබන තනතුර සටහන් කළ යුතුය ("මැහුම් උපදේශක සහායක සේවාව ලබාදීම සඳහා අයදුම්පත්‍රය")

2025.04.11

ඒ.එච්.එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ
නාගරික කොමසාරිස්
මහනුවර මහා නගර සභාව